# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1959/6 - 2016 මාර්තු මස 21 වැනි සඳුදා - 2016.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීම) පනත**

ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය

2014 අංක 3 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතෙහි 7 වැනි වගන්තියෙහි පවරා ඇති බලතල අනුව භූ විද්‍යා ආයතනය විසින් සකස් කරන ලද රීති.

හිටිහාමි මුදියන්සේලාගේ රංජිත් ප්‍රේමසිරි,
මහ ලේකම්,
භූ විද්‍යා ආයතනය, ශ්‍රී ලංකාව.

2016 මාර්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මෙම රීති 2014 අංක 1 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය ලෙස හඳුන්වනු ලැබේ. — නාමය

2. ආයතනයේ ලියා පදිංචි කාර්යාලය පවත්වාගෙන යා යුතු ස්ථානය සභාව විසින් තීරණය කළ යුතු ය. ආයතනයේ ලියාපදිංචි කාර්යාලය සාමාන්‍යයෙන් කොළඹ පවත්වාගෙන යා යුතු ය. එහෙත් සභාව සභාවේ තීරණයක් මගින් ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම දිස්ත්‍රික්කයකට ගෙන යාමේ බලය සභාව සතු ය. — ලියාපදිංචි කාර්යාලය

3. ආයතනයේ සාමාජිකත්වය ආයතනීය සාමාජිකයන්, ආයතනීය නොවන සාමාජිකයින් සහ විදේශීය සාමාජිකයන්ගෙන් සමන්විත වේ. — සාමාජිකත්වය

4. (1) ආයතනයේ සංස්ථාපිත සාමාජිකයන් වන්නේ ''අධිශිෂ්‍ය සහ සාමාජික'' යන පදවි දරන්නෝ ය.
   (2) ආයතනික සාමාජිකයන් ලෙස වලංගුභාවය අපේක්ෂා කරන අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු ය.
      (අ) භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ
      (ආ) භූ විද්‍යාව විෂයක් ලෙස ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් විද්‍යාපති මට්ටමේ M (විද්‍යාපති හෝ දර්ශනපති) ගේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම අනුමත කළ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද භූ විද්‍යා ක්ෂේත්‍රයේ හෝ රීතීන් සඳහා වූ (අ) උපලේඛනයේ සඳහන් කර ඇති ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) ට අනුව ඕනෑම සමජාතිය විෂයක් සඳහා ලද ආචාර්ය (D) මට්ටමේ උපාධියක්.
   (3) පිළිගත් උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් නොමැති වෘත්තිකයකු විසින් ආයතනික සාමාජිකයකු ලෙස වලංගුභාවය පතා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සභාව පිළිනොගනී.

(4) සජාතීය විෂයන් සම්බන්ධයෙන් මත භේදයක් පැන නගින කල්හි සභාවේ තීරණය අවසන් තීරණය වේ.

(5) අයදුම්කරුවන්ට මඟ පෙන්වීමක් ලෙස සහ වලංගු කිරීම සඳහා අයදුම් පත ඇගයීමේ දී මෙම නීති සඳහා ආයතනය අයදුම්කරුවන්හට තම අවශ්‍ය නිපුණතාවන් සාර්ථකව විදහාපෑමට හැකියාවක් ලබා දෙන ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධි අත්දැකීම අතර සබඳතාව සම්බන්ධතාවයෙන් මග පෙන්වීම උපලේඛනයෙහි දක්වා ඇත. මෙය සැලකිය යුත්තේ අයැදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ආදිය අවශ්‍ය අවම අදාළ පළපුරුද්ද පිළිබඳ පොදු මග පෙන්වීමක් ලෙස ය.

(6) රීති හා රෙගුලාසිවල 4.2 වගන්තිය යටතේ ආයතනීය සාමාජිකයෙකු (අධිශිෂ්‍ය හෝ සාමාජික) ලෙස ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු යැයි සභාව තීරණය කර ඇති සාමාජිකයන්ගේ ලැයිස්තුවක් පළ කර සියලු ආයතනීය සාමාජිකයන් අතර බෙදා හරිනු ලැබේ. එවන් පළකිරීමක් සිදු කළ දින සිට සති 02 ක කාලයක් ඇවෑමෙන් ඕනෑම අයදුම්කරුවකුගේ සුදුසුකම් හෝ චරිතය පිළිබඳව සන්නිවේදන සභාව වෙත වාර්තා කිරීමට සූදානම්ව සිටින අතර එම පුද්ගලයා අධිශිෂ්‍ය හෝ සාමාජිකයකු වීමට යෝග්‍ය හා නිසි පුද්ගලයකු යැයි සභාව සෑහීමට පත් වේ නම් පමණක් එම අයදුම්කරු පිළිගත් බව ප්‍රකාශ කරනු ලැබේ.

(7) ඇතුළත්කරගනු ලැබීමෙන් අනතුරුව සෑම ආයතනීය සාමාජිකයකු සඳහාම තමා කැමති නම් එම සාමාජිකයා සහභාගී වන පළමු මහා සභා රැස්වීමේ දී එම රැස්වීමේ සභාපති හෝ මුලසුන දරන පුද්ගලයා විසින් හඳුන්වා දෙනු ලැබිය හැකි ය.

අධි ශිෂ්‍යයන්

5. අධි ශිෂ්‍යයෙකු වශයෙන් ඇතුළත් වීමට අපේක්ෂා කරන සෑම පුද්ගලයෙකුම

(1) වයස අවුරුදු 45 ට වැඩි විය යුතු ය.

(2) සාමාජික ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය ආකාරයට මෙම රීතීන්හී ''අ'' උපලේඛනයේ සඳහන් කොන්දේසි හා සුදුසුකම් සපුරා ඇති සාමාජිකයෙකු හෝ පුද්ගලයෙකු විය යුතු ය.

(3) පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු ය.

(අ) මෙම රීතීන්හි ''අ'' උපලේඛනයේ විශේෂිතව දක්වා ඇති ආකාරයට භූ විද්‍යාව හෝ සජාතීය විෂය ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර හයක (6) පළපුරුද්දක් හා සභාවට පිළිගත හැකි ආකාරයට එහි දියුණුව සඳහා ප්‍රමාණවත් දායකත්වයක් දරා තිබීම හෝ

(ආ) භූ විද්‍යාව පිළිබඳ දැනුම සහ වෘත්තියෙහි කැපී පෙනෙන තත්ත්වයක් අත්පත් කරගෙන තිබීම සභාවෙහි මතය පරිදි පුද්ගලයෙකුව අධි ශිෂ්‍යයකු ලෙස ඇතුළත් කර ගැනීමට සුදුසුකම් ලබා දෙයි.

සාමාජිකයන්

6. ආයතනීය සාමාජික ශ්‍රේණියට ඇතුළත් වීමට අපේක්ෂා කරන සෑම පුද්ගලයෙකු ම

(1) වයස අවුරුදු 30 වඩා වැඩි විය යුතු ය.

(2) මෙම රීතීන්හි උපලේඛනයේ දක්වා ඇති පරිදි ප්‍රමාණවත් වෘත්තීය පුහුණුවක් සහ ප්‍රායෝගික අත්දැකීම් සහිතව අදාළ උපාධිය සහ අධ්‍යාපනය සමග අවශ්‍යතා සපුරාලමින් එවන් මට්ටමක් අත්පත් කර ගෙන සිටිය යුතු ය.

සහ

(3) ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනයේ ආශ්‍රිත සාමාජික ශ්‍රේණියෙහි දැනට වසර තුනක් සිටි එමෙන් ම එම සාමාජිකත්වය හේතුවෙන් විධිමත් අයදුම් කිරීමකින් සහ තෝරා ගැනීමේ කාර්ය පටිපාටියක් මගින් තෝරා ගැනීමට හිමිකම් ලබන පුද්ගලයෙකු විය යුතු ය.

ආයතනීය නොවන සාමාජිකයන්

7. (1) ගරු ආදි ශිෂ්‍යයන්, ආශ්‍රිත සාමාජිකයන්, බලපත්‍රලාභීන්, ශිෂ්‍යයන් සහ ආයතනික සාමාජිකයින් ආයතනීය නොවන සාමාජිකයින් වන අතර මෙම ශ්‍රේණිවලට ඇතුළත් කර ගැනීම සඳහා යෝග්‍යතාව සහ අදාළ වෙනත් අවශ්‍යතා මෙම රීතීන්හි විස්තර කෙරේ.

(2) ආයතනීය නොවන සාමාජිකයන්ට ආයතනයේ මහා සභාව රැස්වීම්වලට සහභාගී වීමට හෝ ඡන්දය භාවිතා කිරීමට හෝ කිසිදු මහා සභා රැස්වීමකට සහභාගී වීමට ඉල්ලීමක් කිරීමට හෝ සහභාගිවීමේ ඉල්ලීමකට අත්සන් කිරීමට හිමිකම් නොලැබෙන අතර ඕනෑම විශේෂ කමිටුවක සාමාජිකයකු ලෙස සේවය කිරීමට හිමිකම ලැබේ.

ගරු සාමාජිකයන්

8. (1) සම්භාවනීය සහ කීර්තිමත් පුද්ගලයන් එක් වරෙකට ඇතුළත් කර ගන්නා එවන් පුද්ගලයන් සංඛ්‍යාව තිදෙනෙකුට නොවැඩි නම් ගරු සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගැනීමේ බලය සභාව සතු ය.

(2) ගරු සාමාජික ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා අයදුම් කිරීමට කිසිදු පුද්ගලයකුට අයිතියක් නැත. ආයතනයේ ආයතනීය සාමාජිකයන් විසින් ගරු සාමාජික ශ්‍රේණිය සඳහා සිදුකරනු ලබන නාමනය කිරීම් සභාව විසින් පමණක් සලකා බලනු ලැබේ. සභාවෙහි සම්පූර්ණ සාමාජිකත්වයෙන් අවම වශයෙන් තුනෙන් දෙකක ඡන්දයක් මත ගරු සාමාජික ශ්‍රේණිය සඳහා සාමාජිකයන් සභාව විසින් තෝරාගත යුතු ය.

9. ආශ්‍රිත සාමාජික ශ්‍රේණියට ඇතුළත්වීමට අපේක්ෂා කරන සෑම පුද්ගලයකුම පහත සඳහන් සුදුසුකම් සපුරා ලිය යුතු ය. ආශ්‍රිත සාමාජිකයන්

(i) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 3, 4, 5 සහ 6 යන මට්ටම්වලින් ප්‍රතීතනය ලබා ඇති භූ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය ලබා වසර තුනක් හෝ ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි 3 සහ 4 සහ 5 මට්ටම්වලින් ප්‍රතීතනය ලද සහ පාඨමාලා තුනෙන් එකක් (33%) අන්තර්ගතයෙන් 3 සහ 4 මට්ටමේ සහ 50% ක් 5 මට්ටමේ භූ විද්‍යාව හෝ සමජාතීය විෂයයන්ගෙන් සමන්විත භූ විද්‍යා සාමාන්‍ය උපාධියෙන් පසු වසර 5 ක් පසුවී තිබිය යුතු ය.

එමෙන්ම,

(ii) සභාව විසින් වරින් වර තීරණය කරනු ලබන ආකාරයට භූ විද්‍යා ක්ෂේත්‍රයෙහි ප්‍රමාණවත් පුහුණුවක් ලබා තිබිය යුතු ය.

10. බලපත්‍රලාභී (Licenciate) සාමාජික ශ්‍රේණියට ඇතුළත්වීමට අපේක්ෂා කරන සෑම පුද්ගලයකුම පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු ය. බලපත්‍රලාභී (Licenciate) සාමාජිකයින්

I. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි 3, 4, 5 සහ 6 මට්ටම්වල ප්‍රතීතනය ලද භූ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබිය යුතු ය. නැතහොත් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි 3 සහ 4 මට්ටම්වල ප්‍රතීතනය ලද සහ විෂය අන්තර්ගතයෙහි 3 සහ 4 මට්ටම්වල තුනෙන් එකක් (33%) සහ 5 වන මට්ටමෙහි 50% ක් භූ විද්‍යා විෂයයන්ගෙන් සමන්විත භූ විද්‍යා විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා වසර 2ක් ගතවී තිබීම.

එමෙන්ම,

II. ආයතනයේ එවැනි විභාග සමත් ව තිබීම හෝ අධ්‍යාපන කමිටුවේ නිර්දේශ මත එම අරමුණ සඳහා සභාව විසින් නිර්දේශ කරන ලද සහ අනුමත කරන ලද වෙනත් එවන් විභාග සමත්වීම.

11. ශිෂ්‍ය සාමාජික ශ්‍රේණියට ඇතුළත්වීමට අපේක්ෂා කරන සෑම පුද්ගලයකුම මෙම අරමුණ සඳහා අධ්‍යාපන කමිටුවේ නිර්දේශ මත සභාව විසින් අනුමත කරන ලද භූ විද්‍යාව හෝ සමජාතීය විෂයයන් පිළිබඳ අධ්‍යයන පාඨමාලාවක් හදාරමින් සිටිය යුතු ය. ශිෂ්‍ය සාමාජිකයන්

12. (1) විදේශීය සාමාන්‍ය සාමාජිකයන් විදේශීය සාමාජිකයන් විය යුතු අතර විදේශීය සිසුන්ගේ සුදුසුකම් මට්ටම් සහ නිපුණතාවන් මෙම රීතීන්හි විස්තර කර ඇත. විදේශීය සාමාජිකයන්

(2) 13 වන වගන්තියට අනුව විදෙස් ආයතනික සිසුහු විදෙස් සාමාජිකයෝ වෙති.

13. (1) සභාවේ යෝජනා සම්මත කරගැනීමකින් ආයතනයේ කාර්‍යයන්ට සහාය දෙන එමෙන්ම ආයතනයේ පොදු අරමුණු පිළිගන්නා ඕනෑ ම ව්‍යාපාරයක්, සංගමයක්, මණ්ඩලයක් හෝ ආයතනයක් ආයතනයේ ආයතනික සාමාජිකයකු ලෙස පත් කර ගනු ඇත. ඔවුන් තමන් විසින් පොදු මහජනතාව වෙත අදාළ භූ විද්‍යාත්මක රාජකාරි ඉටුකරන බවට පොරොන්දු වී බලය පැවරීමේ සහතිකයක් ලබාදීම අවශ්‍ය වේ. ආයතනික සාමාජිකයන්

(2) අදාළ ව්‍යාපාරය, සමාගම, සංගමය, මණ්ඩලය හෝ ආයතනය අනවධානයෙන්, සිතාමතා හෝ වැරදි ලෙස භූ විද්‍යාව වෘත්තියට දායකවන්නේ නම් එම බලපැවරුම් සහතිකය අහෝසි කිරීමේ අයිතිය මණ්ඩලය සතු ය.

(3) ඉහත ඡේදය යටතේ ආයතනික සාමාජිකයකු ලෙස ඇතුළත් කරගත් ඕනෑම ව්‍යාපාරයක්, සමාගමක්, සංගමයක්, මණ්ඩලයක් හෝ ආයතනයක් සභාව විසින් උධෘත කොට දක්වූ හේතුවක් මත තවදුරටත් ආයතනික සාමාජිකයකු නොවන බවත් එබැවින් එම ව්‍යාපාරය, සමාගම, සංගමය මණ්ඩලය හෝ ආයතනය වහාම ආයතනය සාමාජිකයකු බවට පත්වීම අවසන් වන බවට ප්‍රකාශයක් ඕනෑම විටක පළකිරීම සභාවට කළ හැකි ය.

14. (1) ආයතනීය සාමාජික (සාමාජික සහ අධි ශිෂ්‍ය) ශ්‍රේණිවල සාමාජිකයන්හට වරලත් භූ විද්‍යාඥ තත්ත්වය සඳහා අයදුම් කළ හැකි අතර කාර්‍යය පටිපාටිය සහ සපුරාලිය යුතු අවශ්‍යතා අයදුම් කිරීමේ පටිපාටියෙහි ''B'' උපලේඛනයෙහි නිර්දේශ කර ඇති පරිදි ය. වරලත් භූ විද්‍යාඥයා හට තම නමට පසුව (CGeol) යන්න භාවිතා කිරීමට හිමිකම් ලැබේ. සාමාජිකයා විසින් ඒ සඳහා අයදුම්කරන අවස්ථාවේදී අයදුම්පත සමග වෘත්තීය සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. (උපලේඛනය C) වරලත් භූ විද්‍යාඥයා

(2) වරලත් භූ විද්‍යාඥයකු බවට පත්වීම සඳහා අයදුම් කිරීමට යෝග්‍යවීමට ආයතනීය සාමාජිකයකු ලෙස අවම වශයෙන් වසර තුනක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(3) වරලත් භූ විද්‍යාඥයකු සඳහා ඇගයීම 'B' උප ලේඛනයේ ආකාරයට සිදුකරනු ලැබේ.

(4) වරලත් භූ විද්‍යාඥයන්ට ලිපි ලේඛන, වාර්තා, ප්‍රකාශ සහ වෙනත් ඕනෑම ලිඛිත සන්නිවේදන අනුමත කිරීමට භාවිතා කළ හැකි ආයතනයේ වෘත්තීය මුද්‍රාවක් සපයනු ලැබේ. සාමාජිකයා එම ලිපි ලේඛන, වාර්තා, ප්‍රකාශ සහ වෙනත් ඕනෑම සන්නිවේදනයක් පිළිබඳ තම දැනුම දක්වමින් එම මුද්‍රාව මත තම මුල් අත්සන තැබිය යුතු ය. සාමාජිකයා හට අත්සන් කිරීමට බලය ඇත්තේ තමාගේම හෝ ඔහු විසින් තරයේ සමාලෝචනය කරන ලද හෝ සෘජුවම අධීක්ෂණය කරන ලද අයිතමයන් පමණි.

(5) ඉහත වගන්ති උල්ලංඝනය කරන වරලත් භූ විද්‍යාඥයකු හට ප්‍රවේශ සහ ආචාර්ධර්ම ව්‍යවහාර කමිටුවෙහි විමර්ශනයන්ට භාජනය වීමට සිදුවන අතර වැරදි බව පෙනී ගියහොත් දඩමුදලක් ගෙවීමට හෝ කමිටුව විසින් තීරණය කරන පරිදි වසර දෙකක උපරිමයන් දක්වා සාමාජිකත්වය සහ මුද්‍රාව අවලංගු කිරීමට යටත් වේ.

**ශ්‍රේණි දැක්වීමට අක්ෂර භාවිතය**

15. (1) පහත සඳහන් ශ්‍රේණිවල සාමාජිකයන්හට පහත සඳහන් ආකාරයට තම නමට පසුව තම තානාන්තරය භාවිතා කිරීමට හිමිකම් ඇත.

| | | |
|---|---|---|
| වරලත් භූ විද්‍යාඥ | - | (CGeol) |
| ගරු අධි ශිෂ්‍ය | - | FIG SL (HONY) |
| අධි ශිෂ්‍ය | - | FIGSL |
| සාමාජික | - | MIGSL |
| ආශ්‍රිත සාමාජික | - | AMIGSL |
| බලපත්‍රලාභී සාමාජික | - | LIGSL |
| ශිෂ්‍ය සාමාජික | - | තානාන්තරයක් නොමැත. |

කිසිම පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මුලකුරු හෝ "CGEOL" "FIGSL" "FIGSL (Hony)" "MIGSL" "AMIGSL" හෝ "LIGSL" යන තානාන්තර කිසිදු පෞද්ගලික සන්නිවේදනයකදී පොතක්, සඟරාවක හෝ වෙනත් ප්‍රකාශනයක් සඳහා භාවිතා නොකළ යුතු ය. වරලත් භූවිද්‍යාඥ ලේඛනයෙහි නම ඇති සෑම ආයතනීය සාමාජිකයකුටම තමා වරලත් භූ විද්‍යාඥයකු ලෙස විස්තර කිරීමට මෙන්ම "CGEOL, FIGSL (Sri Lanka) හෝ (GEOL, MIGSL,(Sri Lanka) ආදි වශයෙන් කෙටි යෙදුම් තමා අයත් පන්තියෙහි තත්ත්වයට පෙර තම නමට පසුව යෙදීමට හිමිකම් ඇත.

**ශ්‍රේණි පාලනය වන රීති**

16. (1) ප්‍රවේශ සහ ආචාරධර්ම ව්‍යවහාර කමිටුවේ අනුමැතියෙන් තොරව භූ විද්‍යාවට සම්බන්ධ කිසිදු ප්‍රසිද්ධ ප්‍රකාශයක් හෝ වෙනත් කිසිදු සංවේදී ප්‍රකාශයක් සිදු කළ නොහැකිය. ඉන් අනතුරුව ඒවා පොදු මහජනතාවට හෙළි කිරීමට පෙරාතුව මූලික අර්ධ සවිස්තරාත්මක සහ විස්තරාත්මක ආදී වශයෙන් ශ්‍රේණිගත කළ යුතු ය.

(2) ගෙවීමට නියමිත දින සිට වසර තුනක කාලයක් සාමාජික ගාස්තු හිඟ ඕනෑ ම සාමාජිකයෙකුගේ ආයතනයේ සාමාජිකත්වය ඒ නයින් ම අවසන් වුව ද එවන් සාමාජිකයකුට එම හිඟ මුදල සමග වත්මන් වර්ෂයන්හි සාමාජික ගාස්තු ගෙවීමෙන් නැවතත් ඔහු සාමාජිකත්වය දරන ශ්‍රේණියට ම ඇතුළත් වීමට හිමිකම ලැබේ.

ඔහුගේ අයදුම්පත සලකා බැලීම වටින බවට නිර්දේශ කරන බවට සහතික කරමින් එම යෝජනාවට අවම වශයෙන් ආයතනීය සාමාජිකයන් දෙදෙනෙකු සහයෝගය දැක්විය යුතු ය. එවන් යෝජනාවක් ලේකම්ට ඉදිරිපත් කරනු ලබන අතර ඔහු විසින් එය ක්‍රියාත්මකව පවතින රීති හා රෙගුලාසිවලට අනුව වෘත්තීය සමාලෝචන විභාගයට ඇතුළත් කිරීමට අයදුම්කරු සුදුසුදැයි තීරණය කිරීමට සභාවට ඉදිරිපත් කළ යුතු ය.

**සාමාජිකත්වයෙන් නෙරපා හැරීම හා අත්හිටුවීම**

17. (1) ප්‍රවේශ සහ ආචාරධර්ම ව්‍යවහාර කමිටුව විසින් පවත්වන ලද නිසි විමර්ශනයකින් අනතුරුව විෂමාචාරය හෝ සදාචාර විරෝධී චර්යාවන් සම්බන්ධයෙන් වරදකරු බවට පත්වන සහ පූර්ණ සාමාජිකත්වයෙන් තුනෙන් දෙකක් එවන් විනය ක්‍රියාමාර්ගයකට පක්ෂව ඡන්දය දුන් විට එම සාමාජිකයා සාමාජිකත්වයෙන් නෙරපීමට, කාලසීමාවක් සඳහා සාමාජිකත්වය අත්හිටුවීමට, තරවටුකිරීමට හෝ අවවාද කිරීමට සභාවට බලය ඇත. (උපලේඛනය ඈ)

(2) නෛතික වගකීමක් ඇති සාමාජිකයකුට හෝ ආයතනීය සාමාජිකයකු ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුවේ කැමැත්ත ඇති ව තම වෘත්තියෙහි යෙදිය හැකි ය. සාමාජිකයනට යම් උසාවියකින් සිරදඬුවමක් ලැබුණහොත්, සාමාජිකත්වය ඉබේම අහෝසි වේ. කෙසේ වුව ද ඔහුගේ දඬුවමට ක්‍රියාත්මකවීම සම්පූර්ණවීමෙන් අනතුරුව දෙවසරක කාලසීමාවකට පසු ඔහුට නැවත සේවයේ පිහිටුවිය හැකි ය. සාමාජිකත්වය අවසන් කරනු ලබන හෝ අත්හිටුවනු ලබන හෝ සාමාජිකත්වයෙන් නෙරපා හැර ඇති සාමාජිකයකු ඔහු වෙත නිකුත් කරනු ලැබ ඇති ඕනෑම සහතිකයක් වහාම සභාව වෙත ආපසු ලබා දිය යුතු අතර සභාව වෙනස් ආකාරයට තීරණය කරන්නේ නම් හැර ආයතනයේ කිසිදු සුදුසුකමක්, හෝ තානාන්තරයක් තවදුරටත් ඔහු භාවිතා නොකළ යුතු ය.

18. අදාළ සාමාජිකයත්වය ඇතුළත් කර ගනු ලැබ ඇති සෑම ආයතනීය සාමාජිකයකුට, සෑම ආශ්‍රිත සාමාජිකයකු සහ සෑම බලපත්‍රලාභී සාමාජිකයකුට ඉංග්‍රීසියෙන් හෝ කැමති නම් සිංහලෙන් හෝ දෙමළෙන් සුදුසු සහතිකයක් ලැබෙනු ඇත. මෙම සහතිකය ආයතනය සතු දේපළක් ව පවතින අතර එහි ධාරකයා සාමාජිකයකු ලෙස සිටීම අවසන්වන කල්හි ඉල්ලීම මත එය ආයතනය වෙත ආපසු බාරදිය යුතු ය. සහතික

19. සාමාජික ගාස්තු පහත පරිදි ය. සාමාජික ගාස්තු

(i) වරලත් හු විද්‍යාඥ ශ්‍රේණියේ සාමාජිකයන් ඔවුන්ගේ වාර්ෂික දායකත්වය ලෙස ශ්‍රී ලං. රු. 10,000/- ක් ගෙවිය යුතු ය.
(ii) අධිශිෂ්‍ය ශ්‍රේණියේ සාමාජිකයන් තම වාර්ෂික දායකත්වය ලෙස ශ්‍රී ලං. රු. 7500/- ක් ගෙවිය යුතු ය.
(iii) සාමාජික ශ්‍රේණියේ සාමාජිකයන් තම වාර්ෂික දායකත්වය ලෙස ශ්‍රී ලං. රු. 7500/- ක් ගෙවිය යුතු ය.
(iv) ආශ්‍රිත සාමාජික ශ්‍රේණියේ සාමාජිකයන් තම වාර්ෂික දායකත්වය ලෙස ශ්‍රී ලං. රු. 3000/- ක් ගෙවිය යුතු ය.
(v) බලපත්‍රලාභී/ශිෂ්‍ය සාමාජික ශ්‍රේණිවල සාමාජිකයන් තම වාර්ෂික දායකත්වය ලෙස ශ්‍රී ලං. රු. 2000/- ක් ගෙවිය යුතු ය.
(vi) ගරු අධිසාමාජිකයන් කිසිදු දායකත්ව ගාස්තුවක් ගෙවීමට බැඳී නැත.
(vii) විදේශීය සාමාන්‍ය සාමාජිකයන් සහ විදෙස් කාර්මික සාමාජිකයන් තම වාර්ෂික දායකත්වය ලෙස පිළිවෙලින් ඇ. ඩො. 100.00 සහ ඇ. ඩො. 2,000.00 ක් ගෙවිය යුතු ය.
(viii) ආයතනික සහ සාමාජික නව වාර්ෂික දායකත්වය ලෙස ශ්‍රී ලං රු. 20,000/- ගෙවිය යුතු ය.

(2) පෙර රීතියෙහි උපඡේදයෙහි නිර්දේශ කර ඇති සාමාජික ගාස්තුවට අමතරව, මෙම ආයතනයට අලුතෙන් ඇතුළත්වන නව අයදුම්කරුවන් ලේඛන සකස් කිරීමේ පහත සඳහන් ගාස්තු ගෙවිය යුතු ය.

| | | |
|---|---|---|
| අධිසාමාජික | - | ශ්‍රී. ලං. රු. 2000.00 |
| සාමාජික | - | ශ්‍රී. ලං. රු. 2000.00 |
| ආශ්‍රිත සාමාජික | - | ශ්‍රී. ලං. රු. 1000.00 |
| බලපත්‍රලාභී සාමාජික | - | ශ්‍රී. ලං. රු. 1000.00 |
| ශිෂ්‍ය සාමාජික | - | ශ්‍රී. ලං. රු. 500.00 |

(3) ආයතනයේ ආයතනීය සහ ආයතනීය නොවන සාමාජිකයන් සඳහා වාර්ෂික දායකත්ව ගාස්තුව ඉදිරි වර්ෂයේ අප්‍රේල් 30 වන දිනට පෙර ගෙවිය යුතු ය.

(4) ඉහත ගාස්තුවල රජය විසින් පනවා ඇති කිසිදු බද්දක් හෝ ගාස්තුවක් ඇතුළත් නොවේ.

(5) සභාව විසින් සකස් කිරීම සඳහා අයදුම්පතක් බාර නොගත් කල්හි අයදුම්පතට අමුණා ඇති ලේඛන සකස් කිරීමේ ගාස්තුව අයදුම්කරු වෙත ආපසු ගෙවනු ලැබේ.

(6) ශිෂ්‍ය සාමාජිකයන් හැර වෙනත් කිසිදු සාමාජිකයකු විසින් ලේඛන සකස් කිරීමේ ගාස්තු ගෙවිය යුතු නැත.

(7) මෙම රීති යටතේ දායකත්ව ගාස්තු ගෙවීමට බැඳී සිටින සාමාජිකයන් සෑම කැලැන්ඩර වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර දායකත්ව ගාස්තුව ගෙවා සෑම නව කැලැන්ඩර වර්ෂයක් සඳහා ම තම සාමාජිකත්වය අලුත්කර ගත යුතු ය.

(8) සභාවේ තීරණයකින්, ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් හේතුවකින් තම සාමාජිකත්වය අහිමිවන සාමාජිකයන්හට ඔවුන්ගේ සාමාජික කාල සීමාව තුළ ඔවුන් විසින් ආයතනයට ගෙවන ලද කිසිදු දායකත්ව, අයදුම්පතක්, හෝ මාරුකිරීමේ ගාස්තු ආපසු ගෙවන මෙන් ඉල්ලා සිටීමට හිමිකමක් නැත.

20. ආයතනයේ මහා ලේකම් විසින් සාමාජිකයන්ගේ නම් සාමාජික ශ්‍රේණි, ස්ථිර ලිපින, සාමාජිකත්වය ප්‍රදානය කරන ලද දිනයන්, පුද්ගලයකුගේ සාමාජිකත්වය අවසන් වන දිනය, සහ මහලේකම් විසින් අවශ්‍යයැයි අදහස් කරන වෙනත් ඕනෑම තොරතුරක් සඳහන් කොට සාමාජික ලේඛනයක් පවත්වා ගෙන යායුතු ය. සාමාජිකත්ව නාමලේඛනය

21. ආයතනය පහත සඳහන් අයගෙන් සමන්විත සභාවකින් සමන්විත වේ. සභාවේ සංයුතිය

(i) සභාපති (1) උපසභාපති (1) මහලේකම් (1) භාණ්ඩාගාරික (1), සංස්කාරක (1) ප්‍රවේශ සහ ආචාරධර්ම ව්‍යවහාර කමිටුවේ සභාපති (1) සහ අධ්‍යාපන කමිටුවේ සභාපති යන මේ සියලු දෙනා සංවත්සර මහා සභාවේ දී තෝරා පත්කර ගනු ලැබේ.
(ii) වාර්ෂික මහා සභා රැස්වීමේදී තෝරා පත්කරනු ලබන අතිරේක සාමාජිකයන් තිදෙනෙක් (3) සහ
(iii) පසුගිය සභාවේ සභාපති (1) සභාවේ සාමාජිකයකු ලෙස කටයුතු කළ යුතු ය.

(2) සභාපති, උපසභාපති, මහාලේකම්, භාණ්ඩාගාරික, සංස්කාරක, ප්‍රවේශය හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුවේ සභාපති සහ අධ්‍යාපන කමිටුවේ සභාපති යන මේ සියලු දෙනා සභාවට තේරී පත්වීමට සභාවෙහි හෝ ආයතනය විසින් පිළිගත හැකි යම් ජාතික මණ්ඩලයක, සමිතියක කටයුතු කිරීමෙහි වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.

(3) ආයතනයේ දැනට පවතින සභාව මෙම රීතීන්ට අනුව නව සභාවක් පත්කරගන්නා තුරු, ආයතනයේ සභාව ලෙස කටයුතු කළ යුතු ය.

(4) සභාවේ සියලු සාමාජිකයන් ගරු තත්ත්වයකින් කටයුතු කළ යුතු ය.

(5) සභාව අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් රැස්විය යුතු අතර එවැනි හමුවක් සඳහා ගණපූර්නය සාමාජිකයන් පස් (5) දෙනෙකි. න්‍යාය පත්‍රය සහිත එවැනි රැස්වීමක් පිළිබඳ දැන්වීම රැස්වීම් දිනයට අවම වශයෙන් දින 14 කට පෙර ලේකම් විසින් සභාවේ සෑම සාමාජිකයකුටම සැපයිය යුතු ය.

(6) සභාවේ සියලු රැස්වීම් පිළිබඳ දැන්වීම් මහලේකම්වරයා විසින් කළ යුතු ය.

(7) සභාවේ සාමාජිකයකු අනුක්‍රමික සභා වාර තුනක් සඳහා සහභාගි නොවුවහොත් හා ඒ පිළිබඳව හේතු සහිතව ලිඛිතව නොදන්වා සිටිය විටකදී මහලේකම්වරයා විසින් එම සාමාජිකයාට ලිඛිතව ඉල්ලීමක් කර එයට ද ප්‍රතිචාර නොදැක්වූ හොත් ඔහු හෝ ඇයගේ සභාවේ සාමාජිකත්වය අතහැර ගියාසේ සැළකිය හැක.

(8) ආයතනයේ සභාපතිවරයා විසින් යම්කිසි පුද්ගලයෙකුගේ භූ විද්‍යාව සහ අදළ විෂයයන් පිළිබඳ විශේෂඥ දැනුම සැලකීමට ලක් කර සභා වාර සඳහා තත්කාර්ය ලෙස සහභාගී කරවා ගත හැක. එවැනි පුද්ගලයකු සඳහා සීමාසහිත අයිතීන් ප්‍රමාණයක් හිමිවන අතර සභාවේ වැඩ කටයුතුවලට සහභාගී විය හැක. නමුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියක් නොමැත.

(9) සභාපතිවරයාගේ කැමැත්ත ඇතිව එවැනි සාමාජිකයෙකු ඉලෙක්ට්‍රෝනික මාධ්‍යයේ වුව ද සහභාගී කරවා ගත හැක.

(10) සභාපතිවරයා සහ ලේකම්වරයා හැර සභාවේ අනෙකුත් සියළුම සාමාජිකයින් වසරක් සඳහා පළමු අවස්ථාවේදී පත් කළ හැක. මහා සභාවේ තීරණය අනුව එම සියළුම දෙනා තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා දරන ලද තනතුර සඳහා නැවත පත් කළ හැක. සභාපතිවරයා අවුරුදු 3ක සේවා කාලයෙන් පසු නැවත පත් කිරීමට සුදුසුකම් නොලබයි.

(11) සභාවේ සාමාජිකයන් මහා සභා රැස්වීමකදී යෝජනා සම්මතයකින් පත් කළ යුතු ය. ඒ සඳහා සභාවේ නිල සාමාජිකයින් පමණක් සහභාගී කරවා ගත හැක.

(12) සභාවේ ඕනෑම සාමාජිකයකු හෝ සාමාජිකාවක ඔහුගේ ඉල්ලා අස්වීමක් ලිඛිතව සභාපතිවරයාට දැන් වූ විට එම ඉල්ලා අස්වීම වලංගු වන්නේ සභාව විසින් පිළිගත් විට සහ ඉන් පසුව පමණි. සභාපතිවරයා විසින් ඉල්ලා අස්වීමේ ලිපියක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට උපසභාපතිවරයා එම වසරේ ඉතිරි කාල සීමාව සඳහා සභාපතිවරයාගේ වගකීම් දැරිය යුතු ය.

(13) තෝරාපත් කර ගන්නා ලද යම් නිලධාරීන් තාවකාලිකව නොමැති අවස්ථාවක ඒ වෙනුවෙන් වැඩ බැලීමටත් හෝ කාරක සභාවේ පුරප්පාඩුවලට සාමාජිකයන් තෝරාපත් කිරීමට සභාවට බලය පවරා ඇත.

(14) ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තාවක් හා නිසියාකාරව විගණන වාර්තා මහාසභා රැස්වීමට ඉදිරිපත් කළයුතු ය.

සභාවේ බලතල

22. (1) ආයතනයට අදාළ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සභාවට පැවරේ.

(2) පහත සඳහන් රාජකාරී සහ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා සභාවට බලතල ඇත.

(i) ආයතනයට සේවකයන් පත්කිරීම, රාජකාරී පැවරීම, සේවය අත්හිටුවීම සහ සේවයෙන් පහ කිරීම.

(ii) මෙම රීතිවල සඳහන් පරිදි ආයතනයේ විවිධ කමිටුවලට අයත් රාජකාරි නිශ්චිත වශයෙන් සඳහන් කිරීම, එම කමිටුවලට අවශ්‍ය පරිදි බලතල පැවරීම සහ එම බලතල ආපසු ගැනීම.

(iii) සභාව විසින් කමිටුවලට පවරා දුන් බලතල ප්‍රකාරව කමිටු විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත තීරණ ගැනීම.

(iv) සභාවේ සාමාජිකයන් නොවන පුද්ගලයන්හට එවන් කමිටුවල සේවය කිරීමට ඇරයුම් කිරීම.

(v) සභාවේ හෝ මෙම රීතීන්ට අනුකූලව පත්කරනු ලැබූ කමිටුවල ඇතිවිය හැකි පුරප්පාඩු පිරවීම.

(vi) ආයතනයේ ගිණුම් පරීක්ෂා කිරීම සඳහා සුදුසු විගණනකවරුන් පත් කිරීම සහ නිසි ආකාරයෙන් විගණනය කර සහතික කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශය වාර්ෂික මහා සභා රැස්වීමට හා අනෙක් රාජ්‍ය ආයතනවලට ඉදිරිපත් කිරීම.
(vii) ආයතනයේ අරමුණට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නිලතල දරන්නන්හට උපදෙස් දීම හා සංවිධාන කටයුතු කිරීම.
(viii) ආයතනයේ රීති හා රෙගුලාසි අර්ථ විවරණය කිරීම හා පැහැදිලි කිරීම සහ මෙම නීතිරීතිවල ප්‍රතිපාදන සලසා ඇති කරුණු සම්බන්ධව තීරණය කිරීම.
(ix) රීති හා රෙගුලාසිවලට අදාළ සංශෝධන, ප්‍රතිශෝධන හෝ මකාදැමීම සිදුකිරීමට අවශ්‍යතාවයන් පැන නගින විට එවැනි කාර්යයන් පිළිබඳව තීරණය කිරීම හා ඒවා මහා සභා රැස්වීමකදී අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
(x) වාර්ෂික මහසභා රැස්වීම, විශේෂ මහාසභා රැස්වීම, සහ මහා රැස්වීම් රැස්වන ස්ථාන දින සහ වේලාව තීරණය කිරීම.
(xi) ආයතනයේ ලියාපදිංචි කාර්යාලය ස්ථාපිත කිරීම, පාලනය සහ පවත්වාගෙන යාම.
(xii) අන්තර්ජාතික මට්ටමේ දේශන සාකච්ඡා, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
(xiii) භූ විද්‍යාව සහ ඊට සමජාතීය විෂයයන් පිළිබඳව පොත්පත්, සඟරා සහ වෙනත් ලිපි ලේඛන පළ කිරීම.
(xiv) සභාවේ මතයට අනුව ආයතනික අරමුණ අත්පත් කර ගැනීම සඳහා පොදුවේ ආයතනයට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ අනියමින් හේතුවන අනෙකුත් සියලු කටයුතු සිදුකිරීම.

23. (1) සභාපති. — සභාපති
(i) සාමාන්‍ය සභා රැස්වීම, විශේෂ රැස්වීම මහසභා රැස්වීම සහ වාර්ෂික මහසභා රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය.
(ii) සභාවේ තීරණ මහසභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.
(iii) ආයතනයේ නිසි ක්‍රියාකාරීත්වයේදී නිලතල දරන්නන් අධීක්ෂණය කර උපදෙස් දිය යුතු ය.
(iv) හදිසි කටයුතුවලදී සභාව වෙනුවෙන් ක්‍රියා කළයුතු අතර තමා ගත් ක්‍රියා මාර්ග රැස්වීමේදී සභාවට දැනුම් දිය යුතු ය.
(2) සභාපතිවරයා හෝ උපසභාපතිවරයා හෝ දෙදෙනාම පැමිණ නොමැති නම් සභිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයෙකු මුලසුන දැරිය යුතු අතර සභාවේ සහ පොදු සාමාජිකත්වයේ රැස්වීම් මෙහෙයවිය යුතු ය.

24. (1) මහ ලේකම්වරයා ආයතනයේ ප්‍රධාන විධායකයා විය යුතු අතර සභාව විසින් ඔහු වෙත ප්‍රදානය කර ඇති නැතහොත් පවරා ඇති බලතල, වගකීම් හා රාජකාරි ඔහු සතු වේ. — මහ ලේකම්
(2) ඔහුගේ විශේෂ රාජකාරි සහ වගකීම් වන්නේ
(i) සභා රැස්වීම්, සහ ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීම් කැඳවීම.
(ii) සභාපතිවරයාගේ උපදෙස් පරිදි ආයතනයේ විවිධ කමිටු රැස්වීම් කැඳවීම.
(iii) සභාපතිවරයාගේ උපදෙස් පරිදි හෝ 6 දෙනෙකුට නොඅඩු සාමාජිකයන් පිරිසක් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් පරිදි ආයතනයේ විශේෂ මහා සභා රැස්වීම් කැඳවීම.
(iv) සභාව වෙනුවෙන් ලියකියවිලි වලට අත්සන් කිරීම.
(3) මහ ලේකම්වරයා නොපැමිණි අවස්ථාවක සභාව විසින් වැඩි ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන සභා සාමාජිකයෙකු මහ ලේකම්වරයා වෙත පවරා ඇති වගකීම් සහ රාජකාරි නිසියාකාරව ඉටුකරනු ලැබේ.

25. (1) සභාවේ උපදෙස්වලට යටත්ව සභාවට මුදල් එකතු කිරීම ආරක්ෂා කිරීම වියදම් කිරීම යනාදි ක්‍රියාවන් පිළිබඳව භාණ්ඩාගාරිකවරයා වගකිව යුතු ය. — භාණ්ඩාගාරික
(2) වියදම් කරන ලද මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වා ගැනීම සහ බැහැර කරන ලද සියලුම උපකරණ පිළිබඳව භාණ්ඩ ලේඛන හා ලියකියවිලි පවත්වා ගෙනයාම සහ ඉල්ලා සිටිවිට එම ගිණුම් පොත, ලදුපත් සහ ලේඛන සභාවට ලබාදිය යුතු යි.
(3) සභාවේ උපදෙස් පරිදි එම ආයතනයට අයත් මුදල් ආයෝජනය කළ යුතු යි.
(4) ආයතනයේ වාර්ෂික ගිණුම් විගණකවරුන් නිසි ආකාරයෙන් විගණනය කර සහතික කරනු ලබන බවටත් එම ගිණුම් මහ සභා විගණකවරුන් විසින් සම්මතය සඳහා වාර්ෂික මහා සභාවට ඉදිරිපත් කරන බවට වගබලා ගත යුතු ය. එම ගිණුම් සභිකයන් සාමාජිකයන් විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා මහා සභා රැස්වීමක් පැවැත්වීමට නියමිත දිනට දින 7 ට පෙර ලබාදිය යුතු ය.

සංස්කාරක

26. සංස්කාරක

(අ) ආයතනයේ පළ කරන නිල සඟරාව සහ සභාව තීරණය කරනු ලබන ආකාරයට අනෙකුත් එවන් ප්‍රකාශන පළකිරීම සඳහා වගකිව යුතු ය.

(ආ) සභාව තීරණය කරන ආකාරයට කාල විරාමයන්ට අනුකූලව පුවත් හසුන සහ වෙනත් ප්‍රකාශන සම්පාදනය කළ යුතු ය.

ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුව

27. (1) සභාවට අවශ්‍ය යැයි හැඟෙන පරිදි ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුව සහ අධ්‍යාපන කමිටුව සහ වෙනත් එවන් කමිටු පැවතිය හැකි ය.

(2) නිලවරණයෙන් පසුව සභාව විසින් පවත්වනු ලැබූ පළමුවෙනි රැස්වීමේදී ආචාරධර්ම ව්‍යවහාර කමිටුව සහ අධ්‍යාපන කමිටුව පත්කරනු ලැබේ.

(3) ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුවට ආයතනීය සාමාජිකයන් සංඛ්‍යාව 7 දෙනකු ඇතුළත් විය යුතු අතර එම සාමාජිකයන් සංඛ්‍යාවෙන් අවම වශයෙන් දෙදෙනෙකු නිලවරණයෙන් පසු පළමු රැස්වීමේදී පත්කරනු ලදුව එම කමිටුවෙන් බැහැරව යන සාමාජිකයන් විය යුතු ය.

(4) නිලවරණයෙන් පසුව පළමු රැස්වීමේදී සභාව විසින් පත්කරනු ලබන ප්‍රවේශ හා ආචාරධර්ම කමිටුව පහත දක්වා ඇති ආකාරයට සකස් විය යුතු ය.

(i) හය වන රීතියට අනුකූලව වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත්කර ගනු ලබන සභාපතිවරයා.

(ii) නිල බලයෙන්ම සාමාජිකයෙකු වශයෙන් ක්‍රියාකරන ආයතනයේ මහ ලේකම්වරයා.

(iii) නිල බලයෙන්ම සාමාජිකයෙකු වශයෙන් ක්‍රියාකරන අධ්‍යාපන කමිටුවේ සභාපතිවරයා සහ

(iv) අනෙක් ආයතනීය සාමාජිකයන් සතර දෙනා අතර අවම වශයෙන් දෙදෙනකු නිල කාලය අවසන්ව කාරක සභාවේ බැහැරව යන සාමාජිකයන් විය යුතු යි.

(5) ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුව විසින් පහත සඳහන් බලතල භාවිතා කර කාර්යයන් ඉටු කළ යුතු යි.

(i) ආයතනික සාමාජිකයන් හැර ආයතනයේ සාමාජිකත්වය සඳහා ලැබුණු සියලු අයදුම්පත් සලකා බැලීම, හා එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණවලට ලක්කිරීම හා ඒ අයදුම්පත් සම්බන්ධව ලිඛිතව සභාවට නිර්දේශ කිරීම.

(ii) සභාව විසින් ආයතන සාමාජිකයන් හට වෘත්තියෙහි නිසි ආකාරයෙන් යෙදීම සඳහා ආයතනයේ සාමාජිකයන් හට නිවැරදි සහ යෝග්‍ය යැයි සලකනු ලබන ආචාරධර්ම ව්‍යවහාරයන්හි හරය සහ ස්වරූපය පිළිබඳව වරින් වර සභාවට නිර්දේශ කිරීම.

(iii) සභාව විසින් තමන් වෙත යොමු කරනු ලබන ස්වභාවයෙන් සදාචාර විරෝධී හෝ විනය විරෝධී කරුණු පිළිබඳව විමසා ඒ සම්බන්ධව සභාවට නිර්දේශ කිරීම.

(6) ප්‍රවේශ හා ආචාරධර්ම ව්‍යවහාර කමිටුව පත් කිරීමෙන් පසු මසක් තුළ එහි කමිටු රැස්වීමක් පැවැත්විය යුතු අතර එයින් පසු තෙමසකට වරක් රැස්විය යුතු ය.

(7) නිල බලයෙන් සාමාජිකයකු නොවන යම් සාමාජිකයකු පැමිණීමට තමාට ඇති නොහැකියාව සම්බන්ධව ලිඛිතව දැනුම්දීමකින් තොරව අඛණ්ඩ රැස්වීම් තුනකට නොපැමිණි අවස්ථාවක එකී සාමාජිකයා කමිටුව අතහැර ගියා ලෙස සැලකිය යුතු ය.

අධ්‍යාපනික කාරක සභාව

28. (1) නිලවරණයෙන් පසු පවත්වනු ලබන ප්‍රථම රැස්වීමේදී පත්කර ගනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය කමිටුව පත් කළ යුතු අතර ආයතනීය සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(2) නිලවරණයෙන් පසුව සභාවේ ප්‍රථම රැස්වීමේදී පත්කරනු ලබන අධ්‍යාපන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය.

i. රීති අංක 6 අනුව වාර්ෂික මහ සභා රැස්වීමේදී සභාපති.

ii. නිල බලයෙන්ම නියෝජිතයකු ලෙස ක්‍රියා කරන ආයතනයේ මහ ලේකම්.

iii. නිල බලයෙන්ම සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අධ්‍යාපන කමිටුවේ සභාපති.

iv. අවම වශයෙන් නිල කාලය අවසන්ව කමිටුවෙන් බැහැර යන සාමාජිකයන් දෙදෙනෙකු ඇතුළත්ව ආයතනීය සාමාජිකයන් සිවු දෙනෙකු තෝරා පත් කර ගත යුතු ය.

(3) අධ්‍යාපන කොමිෂම පහත සඳහන් බලතල සහ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම සහ ඉටු කිරීම කළ යුතු ය.

i. සියලුම මට්ටම්වල භූ විද්‍යා අධ්‍යාපන ව්‍යාප්ත කිරීම.

ii. ආයතනය විසින් කලින් කලට අවශ්‍ය යැයි හැඟී යන විටකදී නිර්දේශ කරනු ලබන හෝ ප්‍රතිපාදන සලසන, අනුමත කරනු ලබන හෝ විභාග අධ්‍යයන පාඨමාලා හෝ භූ විද්‍යාවේ ශාඛා සඳහා ඩිප්ලෝමා සහතික පත් හා වෙනත් විශිෂ්ටතා ප්‍රදානය කිරීම විභාග පැවැත්වීම හෝ පැවැත්වීමට ප්‍රතිපාදන සැලසීම.

iii. මෙම රීතියෙහි (i) උපඡේදයේ ප්‍රතිපාදන වලට අනුව සලකා බලා අධ්‍යාපන කොමිසමේ කලින් කළට පැන නඟින යම් ඇබැර්තු පිරවීම උදෙසා සභාවට නම් නිර්දේශ කිරීම.

iv. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේ ඵලදායි අරමුණ සඳහා සභාවේ අනුමැතිය ඇතිව අතිරේක සාමාජිකයන් (ආයතනීය හෝ ආයතනීය නොවන) බඳවා ගත හැකි අතර, ඒ කෙසේ වෙතත් එසේ එක් කරගත් සාමාජිකයින්ට කොමිසමේ රැස්වීම් සඳහා ඡන්දය භාවිතා කළ නොහැකි අතර කොමිසමේ පරිදි එවැනි තහනමක් අවශ්‍ය බව පෙනී යන විටකදී රැස්වීමකට හෝ එහි කොටසකට මැදිහත්වීමෙන් බැහැර කරනු ලැබිය හැකි ය.

v. කතිකාචාර්යවරුන් විභාග පරීක්ෂකවරුන් සිසුන් පත් කිරීම, අත්හිටුවීම, ඉවත් කිරීම, ශිෂ්‍යයන්ට සහ එවන් අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට සම්බන්ධ පුද්ගලයන්ට තරයේ අවවාද කිරීම ඇතුළත් ආයතනය විසින් අනුමත කරනු ලබන, පවත්වනු ලබන හෝ අනුග්‍රහය දක්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් සියලු කටයුතුවලදී සභාවට නිර්දේශ කිරීම.

vi. අධ්‍යාපනික සුදුසුකම් අධ්‍යයන විශිෂ්ටතා සම්මාන සහ වෙනත් ප්‍රදානයන් ලැබීමට සුදුසු සිසුන් සභාවට නිර්දේශ කිරීම.

vii. සභාව විසින් නියම කර ඇති දිනකදී කලින් වර්ෂයේ එහි සියලු ක්‍රියාකාරකම් පිළිබඳව වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.

viii. ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ විභාග පාලනය වන රෙගුලාසි සකස් කිරීම සහ ප්‍රතිසංශෝධනය කිරීම ; සහ

ix. අධ්‍යාපන කොමිසමේ පරමාර්ථ අවශ්‍ය වූ වට අරමුදල් සභාවේ අනුමැතියට යටත්ව ආයතනයේ ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව තීරණය ගැනීම.

04. අධ්‍යාපනික කමිටුව එය පත් කරන ලද දින සිට මසක් තුළ රැස්විය යුතු ඉන් පසු මාස 3 කට වරක් රැස්වීම සිදු කළ යුතු ය. රැස්වීමක අවම ගණපූර්ණය සිව් (4) දෙනෙක් විය යුතු ය.

05. අධ්‍යාපන කමිටුවේ කිසිදු සාමාජිකයෙකු නිල බලයෙන් සාමාජිකයෙකු නොවන විටක ඔහු විසින් පිට පිටම එළඹෙන කමටු රැස්වීම් තුනකට ලිඛිතව එවැනි රැස්වීමකට ඔහුගේ සහභාගිවීමට ඇති නොහැකියාව නොදන්වා සහභාගි නොවන විටකදී ඔහු කමිටුවේ සාමාජිකත්වය අත්හැර ගියා සේ සැළකිය යුතු ය.

**මහා සභා රැස්වීම**

29. 01 සියලු මහ සභා රැස්වීම් ආයතනීය සාමාජිකයන් සඳහා පමණක් විවෘත විය යුතු අතර ගණපූර්ණය එවැනි සෑම රැස්වීමක සාමාජිකයින්ගෙන් තුනෙන් එකකට එකක් එකතු කළ සාමාජික ප්‍රමාණය විය යුතු ය.

02 සෑම වසරකම අප්‍රේල් 30 ට පෙර සභාව තීරණය කරන දිනක වාර්ෂික මහ සභා රැස්වීම පැවැත්විය යුතු ය.

03 වාර්ෂික මහ සභා රැස්වීම සඳහා තීරණය කරන දිනට අවම වශයෙන් දින 14 කට පෙර සාමාජිකයන්හට ඒ පිළිබඳව දැනුම්දිය යුතු ය.

04 වාර්ෂික මහ සභා රැස්වීම නියම කරගත් දිනයේ නොවැළැක්විය හේතූන් මත පැවැත්වීමට නොහැකි වුවහොත් නියම කොටගත් දිනයේ සිට මසකට නොවැඩි කාලයක් සඳහා පසුවට කල් තැබීමට සභාවට බලය ඇත.

05 සභාවේ නිලතල දරන්නන්, සභාවේ සාමාජිකයන් සහ විගණකවරයා වාර්ෂික මහ සභා රැස්වීමේදී තෝරාපත් කර ගත යුතු ය.

06 මහ ලේකම්වරයා වාර්ෂික මහ සභා රැස්වීමේදී කලින් වර්ෂය පිළිබඳ වාර්ෂික වාර්තාව සහ සභා වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩාගාරික විගණකවරුන් විසින් විගණනය කරන ලද කලින් වසර පිළිබඳ ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

**විශේෂ මහා සභා රැස්වීම**

30. ආයතනික සාමාජිකයන් සභාපතිවරයාගේ උපදෙස් මත හෝ අවම වශයෙන් 25 දෙනෙකු විසින් රැස්වීමක් කැඳවීමට හේතුව පැහැදිලිව සඳහන් කර ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත විශේෂ මහ සභා රැස්වීමක් මහ ලේකම්වරයා විසින් කැඳවනු ලැබිය හැකි ය. එම රැස්වීම කැඳවීමෙහි සඳහන් එකී විශේෂිත අරමුණ

හැර වෙනත් කරුණු එවැනි රැස්වීමක ඇතුළත් නොවිය යුතු ය. එහි දැන්වීම සෑම ආයතනික සාමාජිකයකුටම අවම වශයෙන් දින 7කට පෙර දන්වා යැවිය යුතු ය.

යෝජනා

31. මහ සභා රැස්වීමේදී සාමාජිකයන් විසින් ඉදිරිපත් කිරීමට අදහස් කරන ඕනෑම යෝජනාවක් එවැනි රැස්වීමකට දින 14 කට පෙර සභාව වෙත මහ ලේකම්වරයා මගින් යොමු කළ යුතු අතර, සභාව වෙත එවන ලද යෝජනා අතරින් සභාව විසින් මහ සභා රැස්වීමේදී ඉදිරිපත් කළ යුතු යෝජනා තෝරා ගැනීමේ බලය සභාව සතු ය.

අරමුදල් පාලනය

32. (1) ආයතනයට ලැබෙන දායකත්ව ගාස්තු, දේශීය හෝ විදේශීය ආයතන හෝ පුද්ගලයින් මගින් ලැබෙන පරිත්‍යාග, ශ්‍රී ලංකා ජනරජයෙන් ලැබෙන ප්‍රදාන, ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණ උදෙසා දේශීය හෝ විදේශීය මුලාශ්‍ර මාර්ගයෙන් ලබාගන්නා ණය මුදල් සහ ආයතනයේ චංචල හා නිශ්චල දේපළවලින් ලැබෙන ආදායම ආයතනයට ලැබෙන අරමුදල් ලෙස සැළකිය යුතු ය.

(2) සභාවේ උපදෙස් යටතේ, එම මුදල් ලබාගැනීම එහි භාරකාරත්වය සහ මුදල් වියදම් වගකීම භාණ්ඩාගාරික සතු විය යුතු ය.

(3) සභාව අනුමත කරනු ලබන ආකාරයට ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය නමින් ආයතනය වෙත ලැබෙන සියලුම මුදල් අනුමත බැංකුවක හෝ බැංකුවල හෝ එහි ඉතිරි කිරීමේ ගිණුම්වල ස්ථාවර තැන්පතු, රක්ෂණ ආයතන හෝ වෙනත් මූල්‍ය ආයතනයක තැන්පත් කළ හැකි අතර, චෙක්පත් මගින් හෝ වෙනත් ලේඛන මගින් මුදල් ලබාගන්නා විටකදී භාණ්ඩාගාරික අත්සන් කර තිබිය යුතු අතර මහ ලේකම්, හෝ සභාපතිගේ අත්සන් තිබිය යුතු ය.

(4) විදේශ මුදල්, අණකර තැපැල් මුදල් හුවමාරු, ටෙලිග්‍රාප් මුදල් හුවමාරු හෝ වෙනත් ආකාරයකින් ලැබෙන සියලු මුදල් උචිත අධිකාරියක අනුමැතිය මත ඕනෑම අනේවාසික මුදල් ගිණුමක හෝ විදේශීය බැංකුවක තැන්පත් කළ හැකි ය. එසේ වුවද භාණ්ඩාගාරික විසින් එවැනි බැංකුවක, රක්ෂණ සමාගමක, මූල්‍ය සමාගමක, වෙනත් මූල්‍ය ආයතනය, එවැනි බැංකුවක, ශාඛාවක, මූල්‍ය සමාගමක් හෝ වෙනත් මුල්‍ය ආයතනයක එවැනි මුදල් හුවමාරුවක් පිළිබඳ අවශ්‍යතාවයන් වාර්තා කළහොත්, එවැනි හුවමාරුවක් පිළිබඳ අවශ්‍යතාවයන් වාර්තා කළහොත්, එවැනි හුවමාරුවක් සිදු කිරීමට බලයදීමට, චෙක්පත් හෝ වෙනත් ලේඛන අත්සන් කිරීමට පුද්ගලයන් නම් කිරීමට සභාවට බලය ඇත.

(5) වාර්ෂික මහ සභා රැස්වීමේදී විගණකවරුන් විසින් නිසියාකාරව විගණනය කොට සහතික කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව සභාවේ අනුමැතිය මත භාණ්ඩාගාරිකවරයා විසින් ඉදිරිපත් කළ යුතු අතර, විගණකවරයාගේ වාර්තාව සහ එකී වාර්ෂික ගිණුම් වාර්තාව වාර්ෂික මහ සභා රැස්වීමේදී විශ්ලේෂණයට සහ අධ්‍යයනයට පුද්ගලයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතු ය. එකී කමිටුවට භාණ්ඩාගාරික මගින් වාර්තාවට සහ ගිණුම් ප්‍රකාශයට සම්බන්ධ තොරතුරු ලබාගැනීමට බලය තිබි ය යුතු අතර, වාර්ෂික මහා සභා රැස්වීමේ දින සිට මසක් තුළ සුදුසු ක්‍රියාවන් සඳහා නිර්දේශයන් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

විගණකවරු

33. 01 විගණකාධිපති ජනරාල්වරයා හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලැබ සුදුසුකම් ලත් විගණකවරයෙකු ආයතනයේ ගිණුම් විගණනය කළ යුතු ය.

සභාවට නඩු පවරා ඇති විට කාර්ය පටිපාටිය

34. ආයතනයට එරෙහිව අධිකරනයේ නඩුවක් පවරා ඇති විටෙක ආයතනය වෙනුවෙන් පෙනී සිටීමටත්, කර්තව්‍යන් සහ වගකීම් සියලු බලතල ක්‍රියාවේ යෙදවීමට සහ ඉටුකිරීමට මෙන්ම සභාවේ එකඟතාවය මත සභාවේ වෙනත් සාමාජිකයෙකුට බලතල පැවරීමටත් සභාපතිවරයාට හා මහ ලේකම්වරයාට බලය ඇත.

රීති සංශෝධනය කිරීම

35. 01 ආයතනයේ රීති ප්‍රතිශෝධන කිරීම, පරිඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම එකී පරමාර්ථය සඳහා කැඳවනු ලැබූ මහ සභා රැස්වීමකට පැමිණ සිටින ආයතනීය සාමාජිකයින් ගණනින් 2/3 කට නොවැඩි ඡන්දයකින් හැර සිදු නොකළ යුතු ය.

02 මහ ලේකම් හරහා සභාව වෙත මහ සභා රැස්වීම් පැවැත්වීමට සති දෙකකට නොවැඩි කාලයකට පෙර යෝජිත ප්‍රතිශෝධන, සංශෝධන සහ ඉවත් කිරීම් පිළිබඳව ලිඛිතව දැන්වීමකින් දන්වා තිබිය යුතු ය.

03 සභාව අනුමත කරන ලද ආකාරයට මෙම රීති සංශෝධනයන්, ප්‍රතිශෝධනයන් සහ ඉවත් කිරීම් විශේෂිත මහ සභා රැස්වීමකදී මහ ලේකම්වරයා විසින් හෝ ඔහු නොමැති විටෙක මහ සභා රැස්වීමේදී ඔහුගේ තනතුරේ කටයුතු කරන තැනැත්තා විසින් යෝජනා කළ යුතු ය.

36. සන්දර්භය මත අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස පද මෙම රීතීන්හි :- අර්ථ නිරූපණය

''ආයතනය'' යන්නෙන් භූ විද්‍යා ආයතනය අදහස් වන අතර, ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය, ලෙස භාවිත කිරීම හා හැඳින්වීම සිදු කරන අතර, වර්ෂ 2014 අංක 03 දරන ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථා ගත කිරීමේ) පනත යටතේ සංස්ථාගත කර ඇත.

''සභාව'' යන්නෙන් 5 වන වගන්තියේ පළමු උපවගන්තිය මගින් ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ ආයතනයේ කටයුතු පරවා දී ඇති ආයතනයේ සභාව අදහස් කෙරේ.

''භූ විද්‍යාඥයා'' යන්නෙන් භූ විද්‍යාව හෝ සජාතීය විෂයන්හි පුහුණුවේ යෙදෙන තැනැත්තා යන්න අදහස් වේ.

''භූ විද්‍යාව හෝ සජාතීය විෂය'' යන්නෙන් සමාන්‍යයෙන් පිළිගැනෙන භූ විද්‍යාවට සම්බන්ධ සියලු විෂයයන් වන භෞතික භූ විද්‍යාව, ස්පටික විද්‍යාව, ඛනිජ විද්‍යාව, පාෂාණ විද්‍යාව, ජල භූ විද්‍යාව, ඡායාරූප භූ විද්‍යාව, ව්‍යුහාත්මක සහ ක්ෂේත්‍ර භූ විද්‍යාව, භූ භෞතික විද්‍යාව, භූ රසායන විද්‍යාව, ඉංජිනේරු භූ විද්‍යාව, පාරිසරික භූ විද්‍යාව, සමස්ථානික භූ විද්‍යාව, ඛනිජ තෙල් භූ විද්‍යාව, සාගර භූ විද්‍යාව, මැණික් විද්‍යාව, ආර්ථික භූ විද්‍යාව, ඛනිජ ගවේෂණය, පොසිල විද්‍යාව සහ භූ විද්‍යාත්මක ආපදා අදහස් කෙරේ.

''මහා සභා රැස්වීම'' යන්නෙන් වාර්ෂික මහා සභා රැස්වීම හෝ විශේෂ මහා සභා රැස්වීම අදහස් වේ.

04 - 422

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.